බුද්ධ ධර්මය 23 පාඩම - 10 ශ්‍රේණිය

# ශ්‍රද්ධාව නිවන් මගෙහි පිවිසුමයි

- ''සැදැහැවත් කම'' යනු සසර දුකින් මිදීමට හේතුවන නිවන් මගට පිවිසෙන දොරටුවයි.

- ''ශ්‍රද්ධාබීජං තපෝ වුට්ඨී'' යන ගාථා පාඨයේ ශ්‍රද්ධාව බීජයක් ලෙස දක්වා ඇත. එම සද්ධා බීජය වර්ධනය වී ''ප්‍රඥා'' නමැති ආලෝකය දක්වා වර්ධනය වේ.

රාග, ද්වේශ, මෝහ නසා ලබන නිවන

ප්‍රඥා

සමාධි

ශීල

අවෙච්චප්පාසාදය

ශ්‍රද්ධාව

❖ ශ්‍රද්ධාව යනු ත්‍රිවිධ ත්‍රිවිධ රත්නය කෙරෙහි ඇතිවන පැහැදීමයි .

❖ අවෙච්චප්පාසාදය යනු කරුණු දැනගෙන තෙරුවන කෙරෙහි ඇතිවන පැහැදීමයි.

කෙසේ වෙතත් සැදැහැවතා ක්‍රමානුකූලව නිවන කරා ගමන් කරයි.

# ශ්‍රද්ධාව ප්‍රධාන කොටස් දෙකකි

ශ්‍රද්ධාව

අමූලිකා ශ්‍රද්ධාව

මෝහය සමඟ මිශ්‍ර වූ
ශ්‍රද්ධාව අමූලිකා ශ්‍රද්ධාවයි

අකාරවතී ශ්‍රද්ධාව

ප්‍රඥාව සමඟ මුසු වූ ශ්‍රද්ධාව
ආකාරවතී ශ්‍රද්ධාවයි

# ශ්‍රද්ධාව ප්‍රධාන කොටස් දෙකකි

ශ්‍රද්ධාව

**අමූලිකා ශ්‍රද්ධාව**

අරටුව නොමැති බට ගසක
ඇතුළත හිස්ය. එසේම මෙම
ශ්‍රද්ධාව නිසා නිවන් ලැබිය
නොහැකිය.

**අකාරවතී ශ්‍රද්ධාව**

අරටුව සහිත ගසක් මෙන්
ක්‍රමානුකූලව මෝරා යන
ප්‍රඥාව සහිතව නිවන්
අවබෝධ කරගනී.

# ශ්‍රද්ධාව ප්‍රධාන කොටස් දෙකකි

## ශ්‍රද්ධාව

- අමූලිකා ශ්‍රද්ධාව
- අකාරවතී ශ්‍රද්ධාව

බෞද්ධයකු වීමට මූලික සුදුසුකම වන්නේ ශ්‍රද්ධාවයි

# ශ්‍රද්ධාව ප්‍රධාන කොටස් දෙකකි

## ශ්‍රද්ධාව

- අමූලිකා ශ්‍රද්ධාව
- අකාරවතී ශ්‍රද්ධාව

රාගය නම් - අරමුණුවල ඇලීමයි

ද්වේෂය නම් - අරමුණුවල ගැටීමයි

මෝහය නම් - අරමුණේ මුලා වීමයි

සැදැහැවතා මේ රාග ද්වේශ මෝහ දුරු කර නිවන් අවබෝධ කර ගනී.

# සැදැහැවත් තැනැත්තා,

දහම් ගුරුවරු වෙත එළඹේ එළඹ, ඇසුරු කරයි. ඇසුරු කරන්නේ, කන් යොමුකරයි. කන් යොමු කරන්නේ, දහම් අසයි. දහම් අසා සිත තබාගනී. සිත තබාගෙන අරුත් විමසයි. අරුත් විමසා වටහා ගනියි. වටහාගෙන ධර්මයේ කැමති වෙයි. එහි හැසිරෙයි. භාවනාවට යොමුවෙයි. කෙළවර පරම සත්‍ය විනිවිද දකී. ප්‍රත්‍යක්ෂ කරයි. නිවන් අවබෝධ කරයි.

# ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) ශ්‍රද්ධාව කෙටියෙන් හඳුන්වන්න.
2) අවෙච්චප්පසාදය කෙටියෙන් හඳුන්වන්න.
3) ශ්‍රද්ධාවේ ආකාර දෙක සඳහන් කරන්න.
4) රාග ද්වේශ මෝහ යන්න කෙටියෙන් හඳුන්වන්න.
5) රාග ද්වේශ මෝහ නැති කිරීමට කුමන ශ්‍රද්ධාවක් වැඩිය යුතුද?
6) මාස ගණනක් බුදුහිමි සමීපයේ සිට පරීක්ෂාකළ බ්‍රාහ්මණ තරුණයා කවුද ?

## පිළිතුරු පත්‍රය

1) තෙරුවන කෙරෙහි ඇති ඇතිවන පැහැදීම
2) තෙරුවන කෙරෙහි කරුණු දැනගෙන ඇතිවන පැහැදීම
3) අමූලිකා සහ හා ආකාරවතී
4) රාග අරමුණුවල ඇලීම ද්වේශ අරමුණු වල ගැටීම මෝහ අරමුණෙහි මුළාවීම
5) ආකාරවතී සද්ධාව වැඩිය යුතුය
6) බ්‍රහ්මායු නම් බ්‍රාහ්මණ තරුණයා

සැකසුම : H.W.K. හර්ෂදේව (දොන් පේද්‍රික් විද්‍යාලයේ ආචාර්ය)